සැ. යු. - 2023.07.14 දින පළ කරන ලද අංක 2341 *ගැසට් පත්‍රයේ* I/II (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,342 - 2023 ජූලි මස 21 වැනි සිකුරාදා - 2023.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 254 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 257 |


*සැ. යු.*- (i) විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 අගෝස්තු මස 11 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජූලි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


253- B 082475- 353 (2023/07)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩස් කොමසාරිස් (අන්තර් පළාත්) ඩී. අනෝමා දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.10.30 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර18770 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පොල්ගහවෙල, ඇපාකන්ද, ගල්කොටුව පදිංචි අරන්නෑගොඩ කංකානමලගේ ලීලාවතී වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක F/23/387/89 යටතේ 1989.08.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම අකමැති වීමෙන් අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත් නම් එය **2023.08.21** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩපොල ඕතොට නැගෙනහිර කෝරළේ 937 - ඇපාකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇපාකන්ද නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කුරුණෑගල මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක මු. පි. කු. 5 දරන කට්ටි කැඩීමේ අංක 13 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ, ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් 26 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූද රජයේ ඉඩම : ගල්කොටුව මූකලාන

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 12, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 12, |
| *දකුණට* | : පී. පී. ඒ. 1379/3 කැබලි අංක 22, |
| *බස්නාහිරට* | : කැබලි අංක 14. |

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2020 ඔක්තෝබර් මස 21 වැනි දින

07-174

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ඉලංගරත්න පතිරාජගේ නුවන් ප්‍රසාද් තිලකරත්න වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.08.08 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 115847 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මූණමල්දෙනිය, කඹුරාපොල පදිංචි දෙහිවලගේ බේබි නෝනා වෙත ප්‍රදානය කොට කුලියාපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කුලි H 6/130 යටතේ 1997.09.11 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත් නම් එය **2023.08.21** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුගම්පල හත්පත්තුවේ යටිකහඋතුරු කෝරළේ 1402 - කඹුරාපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කඹුරාපොල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කුරුණෑගල මිනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 2151 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 112 කොටසක් දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/ අක්කර 0.099 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : කඹුරාපොලවත්ත

| | |
|---|---|
| *උතුරට* | : අඩි 12 පාර, |
| *නැගෙනහිරට* | : ඩී. මාගුට්ගේ ඉඩම ද (කැ. අ. 112 කොටසක්), |
| *දකුණට* | : අඩි 08 පාර ද, |
| *බස්නාහිරට* | : අඩි 08 පාර ද වේ. |

අයි. පී. එන්. පී. තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
පඬුවස්නුවර - බටහිර.

2023 පෙබරවාරි මස 24 වැනි දින

07-175

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එල්. එන්. පියුමලී ලියනගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.07.12 දින ප්‍රදානය කර ඇති අංක ගා/9/ප්‍ර15467 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මුලන, නරාවල පදිංචි සෝමසිරි නානායක්කාර කුඩාච්චිවෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී. 06/38 යටතේ 2005.06.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත් නම් එය **2023.09.01** දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත් සතර පත්තුවේ/ කෝරලයේ IIIඑෆ් මුලන නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නරාවල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 90/3/2 ඕ18/36-37 දරන ක්ෂේත්‍ර පත්‍රයේ/ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු.පි.ගා. 2506 දරන කට්ටි කැඩීමේ පිඹුරේ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 90/3(0/184 A ) දරන රේඛා සටහනේ අංක 19 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.050 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මුලනහේන.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 15, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 20, |
| *දකුණට* | : කැබලි අංක 09 සහ 16, |
| *බස්නාහිරට* | : කැබලි අංක 18. |

එල්. එන්. පියුමලී ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
බෝපෙ පෝද්දල.

2023 ජුනි මස 14 වැනි දින.

07-182/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එල්. එන්. පියුමලී ලියනගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.05 දින ප්‍රදානය කර ඇති අංක ගා/9/ප්‍ර26233 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මුලන, නරාවල පදිංචි හල්ලොලුව කංකානම්ගේ පොඩි හාමිනේ වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී. 06/169 යටතේ 1996.04.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.05.01** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත් සතර පත්තුවේ/ කෝරලයේ IIIඑෆ් මුලන නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නරාවල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ඕ18/36, 37 දරන ක්ෂේත්‍ර පත්‍රයේ/ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු.පි.ගා. 2506 දරන කට්ටි කැඩීමේ පිඹුරේ 42 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.050 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මුලන

| | |
|---|---|
| *උතුරට* | : මෙම පිඹුරේ කැබලි අංක 41 2/2, |
| *නැගෙනහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 43, |
| *දකුණට* | : මෙම පිඹරේ කැබලි අංක 47, |
| *බස්නාහිරට* | : මෙම පිඹරේ කැබලි අංක 41 1/2. |

එල්. එන්. පියුමලී ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
බෝපෙ පෝද්දල.

2023 ජුනි මස 14 වැනි දින.

07-182/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ප්‍රභාෂි චාරුන්දි විදානපතිරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.06.21 දින ප්‍රදානය කර ඇති අංක ගා/9/ප්‍ර 56129 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කාසල්හිල් වත්ත, නාරාවල, පෝද්දල පදිංචි වැලිගම පල්ලියගුරුගේ ලයනල් වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී. 08/72 යටතේ 2000.12.11 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය මෙම ගැසට් නිවේදනය පල වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත් සතර පත්තුවේ/ කෝරලයේ IIIඒ මගදෙනිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නරාවල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක බී.පී.පී/96/01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු.පි.ගා. 1178 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 157 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් 15 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දූක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : කාසල්හිල්වත්ත

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 156, 152 ඉඩම්, |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 152, 167 ඉඩම්, |
| *දකුණට* | : කට්ටි අංක 167 ඉඩම් හා ප්‍රවේශ මාර්ගය, |
| *බස්නාහිරට* | : කට්ටි අංක 156 ඉඩම හා ප්‍රවේශ මාර්ගය. |

ප්‍රභාෂි. සී. විදානපතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
බෝපෙ - පෝද්දල.

2019 දෙසැම්බර් මස 07 වැනි දින.

07-182/3

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.10.06 දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/589 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නුවර පස්ස ජේඩිගේ මෙයියා වෙත ප්‍රදානය කොට ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.09.01** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

#### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුවේ/ කෝරළේ 28ඒ වැල්ලවිලමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කල්එළිය නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එල් 2/78 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ මු.පි.කො. 1619 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/ අංක 101 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 86, |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 102, |
| *දකුණට* | : ජනපද පාර, |
| *බස්නාහිරට* | : කට්ටි අංක 100. |

ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2023 ජනවාරි මස 31 වැනි දින

07-242

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67893.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L11/04/
පලු/දීකා.

### අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 589 - හබරණ ග්‍රාම නිලධාරී වසමේ හබරණ ගමේ ඉඩම් නිලධාරී (පළාත්) විසින් සකසන ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් 21 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා දිසානායක මුදියන්සේලාගේ රන්දෙව් නිල්කමල් දිසානායක විසින් ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | හබරණ දඹුල්ල ප්‍රධාන පාර ද , |
| *නැගෙනහිරට* | : | ඒ. ඒ. ගුණසේකර හා දීපිකා පැල්පිටිගල පදිංචි ඉඩම , |
| *දකුණට* | : | කේ. ඒ. පියසේනගේ ඉඩම , |
| *බටහිරට* | : | බී. ඒ. පී. ජයසේකරගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2022.11.16 දින සිට වසර 30 ක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (5,000,000)ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2022.11.16 දින සිට වසර 05 ක් ගතවන තුරු පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2023 ජූනි මස 25 වැනි දින,
"මිහිකත මැඳුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-176

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/72851.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : PLC/L1/06/07/42.

### අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිඹිරිගස්යාය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කුරුඳුවත්ත ගමේ මූලික පිඹුරු අංක 9786 හි කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1358 ක් වන රජයේ ඉඩම් කොටස මධ්‍යම සංස්කෘතික

අරමුදලේ කටයුතු පවත්වාගෙන යාමට භුක්ති විඳීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් පහත සඳහන් වේ:

*උතුරට* : බෞද්ධාලෝක මාවත සහ කො. 8426 වැනි මූලික පිඹුරේ කැබලි අංක 1 ,
*නැගෙනහිරට* : කො. 8426 වැනි මූලික පිඹුරේ කැබලි අංක 1 සහ රජය හිමිකම් කියන සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාල පරිශ්‍රය ,
*දකුණට* : රජය හිමිකම් කියන සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාල පරිශ්‍රය සහ රජය හිමිකම් කියන නාවික හමුදා පරිශ්‍රය ,
*බටහිරට* : රජය හිමිකම් කියන නාවික හමුදා පරිශ්‍රය සහ බෞද්ධාලෝක මාවත.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.04.11 දින සිට 2053.04.10 දින දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් ½ % කි.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ,

*(ඇ)* මෙම ඉඩම මධ්‍යම සංස්කෘතික අරමුදලේ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුල අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2023.04.11 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීමේ හෝ පැවරීම හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොලියක් අය කරනු ලැබේ.

ගැසට් නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 ජූලි මස 05 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-177

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/66014.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L9/01/04/04.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 503 ගන්තිරියාගම තුලාන ග්‍රාම නිලධාරී වසමේ පහළවෙම්බුව ගමේ මිනින්දෝරු නිලධාරී විසින් සකසන ලද පිඹුරු අංක 2019/98 C හි කැබලි අංක 1,3 හි දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 4 පර්. 34.4 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා දිසානායක මුදියන්සේලාගේ මානුග ඇල්ලේ වලව්වේ නයන රංදික බණ්ඩාර කමලරත්න විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් පහත සඳහන් වේ:

*උතුරට* : ජනිත් චතුරංගගේ ඉඩම, කමල්ගේ ඉඩම, පියල්ගේ ඉඩම ,
*නැගෙනහිරට* : ඇලෝසියස්ගේ ඉඩම ,
*දකුණට* : යෝධ ඇල රක්ෂිතය ,
*බටහිරට* : සුනිල්ගේ ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට හා පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.03.31 සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය වියයුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ,

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඈ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙක් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතු ය,

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2023.03.31 දින සිට වසර 5 ක් ගතවන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 ජූලි මස 04 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-240

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/74760.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L11/04/ නොච්/දීකා.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 326 - ඇහැටුවාගම ග්‍රාම නිලධාරී වසමේ ඇහැටුවාගම ගමේ ඉඩම් නිලධාරී විසින් සකසන ලද NOC/LND/CROWN/1/326/01 දළ අනුරේඛනයේ කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 04 පර්චස් 25.6 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා දේවතා පේඩිගේ චාමර රුවන් කුමාර මයා ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම , |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම , |
| *දකුණට* | : | හුණුවිලගම සිට ඇහැටුවාගම දක්වා මාර්ගය හා මාර්ග රක්ෂිතය , |
| *බටහිරට* | : | රජයේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.03.31 දින සිට වසර 30 ක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය වියයුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ,

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඇ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.03.31 දින සිට වසර 05 ක් ගතවන තුරු පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 ජූලි මස 04 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.